**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**

**2012 සැප්තැම්බර් මස 25 වන දින පෙ.ව 9.30ට**

# න්‍යාය පත්‍රය

I. **ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ**

II. **සභාපතිවරයාගේ නිවේදන**

III. **ලිපි ලේඛන පිළිගැන්වීම**

IV. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**

V. **පෙත්සම්**

VI. **ප්‍රශ්න**

VII. **නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා**

VIII. **අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ**

IX. **පෞද්ගලික පැහැදිලි කිරීම්**

X. **සභාවේ කටයුතු**

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවිනැගුම පනත් කෙටුම්පත** පළාත් සභාව වෙත ඉදිරිපත් කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) ඡේදය පරිදි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීමට හැකිවනු පිණිස 2012.09.28 දිනට ප්‍රථම ලබා දෙන ලෙස, 2012.09.19 දිනැතිව දන්වා ඇති හෙයින්, ද ඒ පිළිබඳව 2012.09.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී කළ පූර්ව සාකච්ඡාවට අනුගතවද අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සඳහන් එකී පනත් කෙටුම්පත සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 15(1), 15(4), 57(1), 57(3), 57(4), 57(5), 63අ(2), 63අ(3), 88(2) හා 88(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය. "*

## XI. පොදු කටයුතු

**ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබිමට.**

යෝජනාව :

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත**

*"**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත,**" බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත්කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) වන ඡේදය පරිදි බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා 2012.09.28 දිනට ප්‍රථම බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දෙන ලෙස දන්වා ඇති හෙයින්, ඊට අවකාශ සැලසෙන පරිදි එම පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාව විසින් සාකච්ඡාකර එළඹෙන තීරණයන්ට අනුකූලව එම අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."*

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2012.09.20
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.